# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எமது இலக்கம் / My No | NWP/CS/F/9 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | |
| දිනය / திகதி / Date | 2023.01. 03 | | |

වයඹ පළාතේ සියළුම ප්‍රධාන ගණන් දීමේ නිළධාරින්

හා ගණන්දීමේ නිලධාරින් වෙත,

## මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම - 2022

පළාත් මූල්‍ය රීති 97.2 අනුව ප්‍රධාන ගණන් දීමේ නිළධාරින් හා ගණන්දීමේ නිළධාරින් සෑම මුදල් වර්ෂයක් අවසානයට තම වැය ශීර්ෂ වලට අදාලව විසර්ජන ගිණුම් හා ආදායම් ගිණුම් සකස් කර ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේ වුවද, වයඹ පළාත් සභාවට අදාල කර ඇති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක : **2022/05හි 10.1** ඡේදය යටතේ (මූල්‍ය ප්‍රකාශ **2022** පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ හා ආකෘති පත්‍ර) දක්වා ඇති පරිදි 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 වන වගන්තිය අනුව සෑම අස්තිත්වයක් විසින්ම මෙතෙක් ඉදිරිපත් කළ වාර්ෂික විසර්ජන ගිණුම් හා ආදායම් ගිණුම් වෙනුවට අදාල ආදායම් හා වියදම් තොරතුරු ඇතුලත් කර මුදල් පදනම යටතේ වන "වාර්ෂික මූල්‍ය ප්‍රකාශන" කට්ටලයක් පිළියෙල කළ යුතු වන අතර 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන **2023** පෙබරවාරි **28** වන දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ.

2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

2.1 සියලුම වාර්තාකරණ ආයතන මෙම චක්‍රලේඛයේ 06 ඡේදයෙන් හඳුන්වා දෙන ආකෘතීන් අනුව 2022 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් A4 කඩදාසියේ වෙන් වෙන්ව පිළියෙල කළයුතුය. ඒසීඒ-එෆ්,ඒසීඒ-පී,ඒසීඒ-සී හා ඒසීඒ-ඩී ආකෘති සිරස් අතටත් (Portrait) අනෙකුත් සියලු ආකෘති තිරස් අතටත්(Landscape) පිළියෙළ කොට සිරස් අතට පොතක් ලෙස බැඳ ඉදිරිපත් කල යුතුවේ.

2.2 ලබා දී ඇති ඒසීඒ-ඩී ආකෘතියට අනුව සෑම මූල්‍ය වාර්තාකරණ ආයතනයක් විසින්ම තම ආයතනයට අදාළ හා අදාළ නොවන මූල්‍ය ආකෘති හඳුනාගත යුතුය.


අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) / இயக்குனர் (கணக்குகள் மற்றும் கொடுப்பனவுகள்) / Director (Accounts & Paymants) — Tel : 037-2221868, Fax : 037-2223731, e-mail : diraccpaynwpc@gmail.com

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதான செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel : 037-2228128, Fax : 037-2223731, e-mail : dcsfnnwpc@gmail.com, dcsfinance@nw.gov.lk